# සංවර්ධන ලොතරැයි මණ්ඩලය

## මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

**(1997 අංක 20 දරන පනත යටතේ ස්ථාපිත කරන ලදි.)**

DLB DEVELOPMENT LOTTERIES

gazette.lk AMBITIONS REALIZED

**සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ පවතින පහත තනතුරු සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 1. සාමාන්‍යාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීම්

**තනතුරු නාමය** : **සාමාන්‍යාධිකාරී**

**පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව** : 01

**වැටුප් කේතය** : HM 2-1

- කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 හි විධිවිධාන අනුව මෙම තනතුරට නියමිත වැටුප් පරිමාණය රු. 161,140 - 12 X 4,850 - 219,340 වන අතර, සේවයට බඳවාගත් දින සිට රු.161,140/-ක මූලික වැටුප් පියවරේ පිහිටුවනු ඇත.

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම (පහත සඳහන් 1.1 හෝ 1.2)**

1.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය / වාණිජ්‍යය / ගණකාධිකරණය හෝ ක්ෂේත්‍රයකට අදාළ ප්‍රථම උපාධියක්

සමග

ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය / වාණිජ්‍යය / ගණකාධිකරණය හෝ ක්ෂේත්‍රයකට අදාළ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම, හෝ කළමනාකරණය පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

උපාධි සුදුසුකම ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 20 ක සේවා පළපුරුද්ද ( අවම වශයෙන් මින් වසර 05ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.)

හෝ

1.2 ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය / වාණිජ්‍යය / ගණකාධිකරණය හෝ ක්ෂේත්‍රයකට අදාළ වෙනත් විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සමග

ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය / වාණිජ්‍යය / ගණකාධිකරණය හෝ ක්ෂේත්‍රයකට අදාළ වෙනත් විෂය ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් ලබා තිබීම.

සහ

ආචාර්ය උපාධියක් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 05 ක විශිෂ්ඨ සේවා වාර්තාවක් හිමි නිලධාරියකු වශයෙන් පළපුරුද්දක් ලබා තිබීම.

1.3 අභ්‍යන්තර අයදුම්කරුවන්

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරක අවම වශයෙන් වසර 05 ක අදාළ විෂය ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සමග බහුවිධ කාර්යන්හි නියුතු කණ්ඩායම් සඳහා නායකත්වය සැපයීමෙහිලා මෙන්ම මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකරණයෙහිලා නිශ්චිත ප්‍රවීණතාව

1.4 **වයස :** අවු 35ට නොඅඩු හා අවු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට හා රාජ්‍ය නිලධාරින්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

1.5 **මූල්‍ය ප්‍රතිලාභ**

I. කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 හි HM 2.1 තනතුරට අදාළ මූලික වැටුප

II. මුදල් අමාත්‍යාංශය විසින් අනුමත කර ඇති අනෙකුත් දීමනා

III. සේවක අර්ථසාධක අරමුදලට 15%ක් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට 3%ක් ආයතනය මගින් ගෙවනු ලැබේ.

IV. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2015 හා එහි අනුශාංගික විධිවිධාන වලට අනුකූලව රියදුරෙකු හා ඉන්ධන සමග නිල රථයක් ලබා දීම.

1.6 සටහන: ද්විතියන පදනම මත බඳවා ගැනීම :-

ඉහත සුදුසුකම් සපුරා ඇති දනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින්ට / නිලධාරිනියන්ට ද්විතියන පදනම මත වසර 02ක කාලයකට රාජ්‍ය සේවයෙන් නිදහස් වී පැමිණිය හැකි අතර, අදාළ අයදුම්පත් එම අයදුම්කරු සේවය කරනු ලබන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරු තෝරා ගනු ලැබුවහොත් මුදා හැරිය හැකි බවට සඳහන් කරමින් අදාළ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරනු ලබන සහතිකයක් ද අයදුම්පතට අමුණා එවිය යුතු ය.

## 2. කලාප කළමනාකරු තනතුර සඳහා බඳවා ගැනීම්

**තනතුරු නාමය** : **කලාප කළමනාකරු II ශ්‍රේණිය**

**පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව** : 02

**වැටුප් කේතය** : JM 1-1

**2026 වසර සඳහා ගෙවන මූලික වැටුප : රු.65,633/-**

(කළ. සේවා චක්‍රලේඛ 01/2025 හි විධිවිධාන අනුව මෙම තනතුරට නියමිත වැටුප් පරිමාණය රු. 72,650-10 X 1,360 -18 X 2,040-122,970 වන අතර, 2027.01.01 දින සිට රු.72,650/-ක මූලික වැටුප් පියවරේ පිහිටුවනු ඇත.)

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම (පහත සඳහන් 2.1 හෝ 2.2)**

2.1 අලෙවි කළමනාකරණය / කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / වාණිජ්‍යය / විද්‍යා විෂයන් / ආර්ථික විද්‍යාව හෝ ඒ හා සමාන විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම සමග සුදුසුකම් ලැබීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවම වශයෙන් වසර 03 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

2.2 අලෙවි කළමනාකරණය / කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / වාණිජ්‍යය / විද්‍යා විෂයන් / ආර්ථික විද්‍යාව හෝ ඒ හා සමාන විෂය ක්ෂේත්‍රයකට ගැලපෙන්නාවූ පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය සමග සුදුසුකම් ලැබීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවම වශයෙන් වසර 03 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 2.3 හෝ 2.4)**

2.3 ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2.4 සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ "කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන" (MA1) සේවා ගණයෙහි II ශ්‍රේණියෙහි මෙම තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2.5 **වයස** - අවු 22ට නොඅඩු හා අවු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට හා

රාජ්‍ය නිලධාරින්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

2.6 මසකට රු.150,000/- ක පමණ මුදලක් උපයා ගැනීමට හැකියාව ඇති අතර, එය මාසිකව වෙනස් වනු ඇත.

2.7 අවශ්‍ය අමතර සුදුසුකම් :-

දමිල භාෂාව කථා කිරීම, ලිවීම, කියවීමේ හැකියාව හා උතුරු නැගෙනහිර ප්‍රදේශවල රාජකාරි කිරීමේ හැකියාව විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. වලංගු රියදුරු බලපත්‍රයක් සමග මෝටර් රථ, යතුරු පැදි පැදවීමේ හැකියාව තිබිය යුතුයි.

## 3. අලෙවි ප්‍රවර්ධන සහකාර තනතුර සඳහා බඳවා ගැනීම්

**තනතුරු නාමය** : **අලෙවි ප්‍රවර්ධන සහකාර III ශ්‍රේණිය**

**පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව** : 01

**වැටුප් කේතය** : MA 3

**2026 වසර සඳහා ගෙවන මූලික වැටුප : රු.49,831/-**

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 හි විධිවිධාන අනුව මෙම තනතුරට නියමිත වැටුප් පරිමාණය රු. 53,940-10 X 800 - 11 X 1,190 - 10 X 1,320 - 5 X 1,350- 94,980 වන අතර, 2027.01.01 දින සිට රු.53,940/-ක මූලික වැටුප් පියවරේ පිහිටුවනු ඇත.)

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් (පහත සඳහන් 3.1 හෝ 3.2)**

3.1 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවි / ව්‍යාපාර / වාණිජ්‍ය / කළමනාකරණය / ආර්ථික විද්‍යාව වැනි ක්ෂේත්‍රයකට අදාළ උපාධියක් ලබා තිබීම සමග අදාළ ක්ෂේත්‍රයේ වසර 01 ක සේවා පළපුරුද්ද හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව / උසස් ජාතික වාණිජ ඩිප්ලෝමාව සමග අදාළ ක්ෂේත්‍රයේ වසර 01 ක සේවා පළපුරුද්ද

3.2 **වයස** - අවු 22ට නොඅඩු හා අවු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට හා රාජ්‍ය නිලධාරින්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

3.3 මසකට රු.121,000/- ක පමණ මුදලක් උපයා ගැනීමට හැකියාව ඇති අතර, එය මාසිකව වෙනස් වනු ඇත.

3.4 **අවශ්‍ය අමතර සුදුසුකම් :-**

ක්ෂේත්‍රගත අලෙවි ප්‍රවර්ධන කාර්යන් සිදුකර තිබීම, වලංගු රියදුරු බලපත්‍රයක් තිබීම සමග යතුරු පැදි පැදවීමේ හැකියාව, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ඇති හැකියාව, දමිල භාෂාව කථා කිරීම, ලිවීම හා තේරුම් ගැනීමේ හැකියාව

## 4. තොරතුරු තාක්ෂණ සහකාර - තනතුර සඳහා බඳවා ගැනීම්

**තනතුරු නාමය** : **තොරතුරු තාක්ෂණ සහකාර -III ශ්‍රේණිය**

**පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව** : **තනතුරු 01 (තොරතුරු ආරක්ෂණ දැනුම සහිත අය සඳහා ප්‍රමුඛත්වය දේ.)**

**වැටුප් කේතය** : MA 3

**2026 වසර සඳහා ගෙවන මූලික වැටුප : රු.49,831/-**

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 හි විධිවිධාන අනුව මෙම තනතුරට නියමිත වැටුප් පරිමාණය රු. 53,940-10 X 800 - 11 X 1,190 - 10 X 1,320 - 5 X 1,350- 94,980 වන අතර, 2027.01.01 දින සිට රු.53,940/-ක මූලික වැටුප් පියවරේ පිහිටුවනු ඇත.)

**අධ්‍යාපන සුදුසුකම් :-**

4.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණ උපාධියක් ලබා තිබීම සමග අදාළ ක්ෂේත්‍රයේ වසර 01 ක සේවා පළපුරුද්ද

විශේෂ සුදුසුකම් : මෙම තනතුර සඳහා Cyber Security මූලධර්ම හා Frameworks පිළිබඳ ශක්තිමත් මූලික දැනුමක්, EDR/XDR, Email Security Gateway, WAF වැනි ආරක්ෂණ තාක්ෂණයන් පිළිබඳ අවබෝධය, Firewalls, IDS/IPS, VPN වැනි ජාල ආරක්ෂණ මෙවලම් පිළිබඳ දැනුම, Nessus, Burp Suite වැනි Risk Management සහ Security Scanning Tools සමග හුරුපුරුදුකම, Encryption, PKI සහ Certificate Management පිළිබඳ මූලික අවබෝධය මෙන්ම Incident Response සහ Digital Forensics මූලික කරුණු පිළිබඳ දැනුම තිබීම අපේක්ෂා කෙරේ.

4.2 **වයස** - අවු 22ට නොඅඩු හා අවු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට හා රාජ්‍ය නිලධාරින්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

4.3 මසකට රු.130,000/- ක පමණ මුදලක් උපයා ගැනීමට හැකියාව ඇති අතර, එය මාසිකව වෙනස් වනු ඇත.

## 5. ක්ෂේත්‍ර ප්‍රවර්ධක තනතුර සඳහා බඳවා ගැනීම්

**තනතුරු නාමය** : **ක්ෂේත්‍ර ප්‍රවර්ධක**

**පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව** : 01

**වැටුප් කේතය** : PL-1

**2026 වසර සඳහා ගෙවන මූලික වැටුප : රු.38,488/-**

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 හි විධිවිධාන අනුව මෙම තනතුරට නියමිත වැටුප් පරිමාණය රු. 40,500-10 X 450 - 10 X 490 - 7 X 540 - 15 X 590- 62,530 වන අතර, 2027.01.01 දින සිට රු.40,500/-ක මූලික වැටුප් පියවරේ පිහිටුවනු ඇත.)

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්**

5.1 බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම

අ.පො.ස (සා/පෙළ) විභාගයේදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයන් 06 ක් සමත් වීම සමග අලෙවි ප්‍රවර්ධන ක්ෂේත්‍රයේ වසරක සේවා පළපුරුද්ද.

5.2 වයස - අවු 18ට නොඅඩු හා අවු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට හා රාජ්‍ය නිලධාරින්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

5.3 මසකට රු.90,000/- ක පමණ මුදලක් උපයා ගැනීමට හැකියාව ඇති අතර, එය මාසිකව වෙනස් වනු ඇත.

5.4 අවශ්‍ය අමතර සුදුසුකම් :-

- ක්ෂේත්‍රගත අලෙවි ප්‍රවර්ධන කාර්යන් සිදුකර තිබීම, වලංගු රියදුරු බලපත්‍රයක් තිබීම සමග යතුරු පැදි පැදවීමේ හැකියාව, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ඇති හැකියාව, දමිල භාෂාව කථා කිරීම, ලිවීම හා තේරුම් ගැනීමේ හැකියාව

## 7. පොදු කොන්දේසි

7.1 **පත්වීමේ ස්වභාවය** :- සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

7.2 **මූල්‍ය ප්‍රතිලාභ**

a. කළ.සේවා චක්‍රලේඛ 01/2025 විධිවිධාන අනුව තනතුරට අදාළ වැටුප

b. මුදල් අමාත්‍යාංශය විසින් අනුමත කර ඇති අනෙකුත් දීමනා (දිරිදීමනා, පැමිණීමේ දීමනා, ප්‍රවාහන දීමනා, ජීවන වියදම් දීමනා....)

c. සේවක අර්ථසාධක අරමුදලට 15%ක් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට 3%ක් ආයතනය මගින් ගෙවනු ලැබේ.

d. ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා බාහිර හා නේවාසික වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමේදී වෛද්‍යාධාර පහසුකම්.

7.3. **වෙනත් :-** සෑම ඉල්ලුම්කරුවෙක්ම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

7.4. **බඳවා ගැනීමේ ක්‍රමය:-**

ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවීමෙන් පසු ඒ ඒ තනතුරට අදාළ වන පරිදි වූ ලිඛිත තරග විභාගයක හා / හෝ පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල (වාචික / ලිඛිත හෝ ප්‍රායෝගික ඉදිරිපත් කිරීමේ පරීක්ෂණ) මත බඳවා ගනු ලැබේ.

රාජකාරී ස්වභාවය අනුව ඉංග්‍රීසි භාෂාව කථා කිරීම, ලිවීම හා තේරුම් ගැනීමේ හැකියාව අවශ්‍ය වන අතර, එය සම්මුඛ පරීක්ෂණයේදී පරීක්ෂාවට ලක්කරනු ලැබේ.

## 8. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය :- 2026.10.09

සියලු අධ්‍යාපන සහතික, වෘත්තීය සුදුසුකම් දක්වන සහතික හා සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකවල, තමා විසින් සහතික කරන ලද පිටපත් සමග සංවර්ධන ලොතරැයි මණ්ඩල නිල වෙබ් අඩවියේ (https://www.dlb.lk/careers/view) ඇතුළත් ආකෘතියට අනුව සකස් කර ගන්නා ලද අයදුම්පත්‍රයක් 2026.10.09 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතු අතර, අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කළ යුතුය. නැතහොත් අයදුම්පත් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මානව සම්පත් හා පරිපාලන අංශයේ තබා ඇති පෙට්ටියට ගෙනවිත් බහාලිය යුතු වේ. අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / අනෙකුත් රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

**සභාපති / ප්‍රධාන විධායක නිලධාරී, සංවර්ධන ලොතරැයි මණ්ඩලය**
**අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02**